# 11 පාඩම, <u>සුරැකුම්පත් යාන්ත්‍රණය</u> ( 5 % )

## සුරැකුම්පතක් යනු කුමක්ද ?

යම් ආණ්ඩුවක් විසින් හෝ සංස්ථාගත කල හෝ සංස්ථාගත නොකල යම් මණ්ඩලයක් විසින් නිකුත් කරන ලද නැතහොත් නිකුත් කිරීමට යෝජිත යම් අයිතිවාසිකමක් වර්ණයක් හෝ ( ඒකක වශයෙන් හෝ අන්‍යාකාරයෙන් විස්තර කරන ලද්දේ වුවද ) එහි හෝ ඒ පිලිබඳව සම්බන්ධතාවයක්ද ඇතුලුව ණයකර, ව්‍යාපාර වස්තු, කොටස්, අරමුදල්, බැඳුම්කර, පාදක කොටගත් විශ්වාසය රඳවා ගනු ලැබූ වත්කම් වල ස්වභාවය කුමක් වුවද අනාගත කරණයන් සහ වර්ණයන්ද ඇතුලුව ව්‍යුත්පන්න හෝ නෝට්ටු හෝ සුරැකුම්පත් යනුවෙන් සාමාන්‍යයෙන් හැඳින්වේ.

1) සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිහිටුවා ඇත්තේ කුමන නීතියක් යටතේද ?

1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පනත මගිනි. මෙය මෙරට මූල්‍ය වෙලඳපොල ගනුදෙනු සම්බන්ධිත නියාමන රාමුවට අදාල ප්‍රධාන ව්‍යවස්ථාපිත නීතියකි. පනතේ දීර්ඝ නාමයට අනුව ශ්‍රී ලංකාවේ කොටස් වෙලඳපොල නියාමනය කිරීම මීට පැවරී ඇත.

2) සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සංයුතිය කෙබඳුද ?

- මහබැංකුවේ අධිපතිවරයා විසින් නම් කරනු ලබන එහි නියෝජ්‍ය අධිපති
- භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්
- සමාගම් ලේකම්
- වරලත් ගණකාධිකාරි ආයතනයේ සභාපති
- නෛතික, මූල්‍ය, බැංකු සහ ව්‍යාපාර ක්ෂේත්‍රවල වෘත්තීමය විශේෂඥතාවය දරන ඉහල පලපුරුද්දක් සහ දක්ෂතාවයක් ඇති පෞද්ගලික අංශයේ 06 දෙනෙකු ( එකතුව - 10 යි, ධූර කාලය වසර 03 යි, නැවත පත් කිරීමට සුදුසුකමු ලබයි.මින් එක් අයෙකුන්ව සභාපති ලෙෂ පත් කෙරේ. )

3) ශ්‍රී ලංකාවේ කොටස් වෙලඳපොල නියාමනය කිරීම සිදුකල යුත්තේ ඇයි ?

කොටස් වෙලඳපොල අනිසි හැසිරීම මෙරට කොයස් වෙලඳපොලේ විශ්වාසය විනාශ කරයි.එය මෙරට ආර්ථික සංවර්ධනය අඩාල කිරීමට හේතුවේ. ඒ අනුව කොටස් වෙලඳපොලේ අනිසි පරිචයන් වැලැක්වීම අත්‍යාවශ්‍ය වේ. ඒ සඳහා කොටස් වෙලඳපොල නියාමනය කිරීම අනිවාරිය වේ.

04. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්යභාරය ?

- සංස්ථාවකට ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් ලෙස ක්‍රියා කිරීම පිණිස බලපත්‍ර ප්‍රධානය කිරීම හා එහි ව්‍යාපාර කටයුතු නිසි ලෙස කරගෙන යන බවට වග බලා ගැනීම.

- යම් අයෙකුට අවස්ථාවෝචිත පරිදි ව්‍යාපාර වස්තු වෙලෙන්දෙකු හෝ ව්‍යාපාර වස්තු සුරුකුම්කරුවෙකු ලෙස ක්‍රියා කිරීම පිණිස බලපත්‍රයක් ප්‍රධානය කිරීම සහ ඔහුගේ ව්‍යාපාර කටයුතු නිසි ලෙස කරගෙන යන බවට වග බලා ගැනීම

- යම් සමාගමකට හෝ කලමනාකරුවන්ට ඒකක භාරයන් පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ප්‍රධානය කිරීම සහ එහි කටයුතු නිසි ලෙස කරගෙන යන බවට වගකීම ගැනීම

- බලපත්‍රලාභී ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයකට කාලයෙන් කාලයට විධාන නිකුත් කිරීම

- ව්‍යාපාර වස්තු බලපත්‍රයක් හිමි අයෙකු විසින් සිය ව්‍යාපාර වස්තු බලපත්‍රය මත වන ගිවිසුම ඉටුකිරීමට අසමත් වීම හේතුවෙන් මුදලින් පාඩු විඳීමට සිදුවන යම් ආයෝජකයන් වෙත වන්දි ප්‍රධානය කිරීම

- සුරැකුම්පත් වෙලඳපොල සංවර්ධනය සම්බන්ධයෙන් ආණ්ඩුවට උපදෙස් දීම

- කොමිෂන් සභාවේ වැඩකටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය සේවකයින් සහ නිලධාරීන් සේවයේ යෙදවීම

- මෙම පනතේ අදාල කාරණා සම්බන්ධයෙන් රීති සෑදීම

- ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා යම් සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම හෝ යම් නියමිත සුරැකුම්පත් සම්බන්ධව වෙලඳාම් කිරීම අත්හිටුවීම හෝ අවලංගු කිරීම

- බලපත්‍රලාභී ව්‍යාපාර වස්තු විනිමය ස්ථාන, ව්‍යාපාර වස්තු වෙලෙන්දන්, තැරැව්කරුවන්, ලැයිස්තුගත කල පොදු සමාගම් ආදියේ ව්‍යාපාර කටයුතු පරීක්ෂාවට භාජනය කිරීම

- බලපත්‍රලාභී ව්‍යාපාර වස්තු වෙලෙන්දෙකු විසින් හෝ ව්‍යාපාර වස්තු ගැනුම්කරුවෙකු විසින් හෝ ව්‍යාපාර විනිමය ස්ථානයක ලැයිස්තුගත කල පොදු සමාගමක් විසින් කරන ලද අයුතු ක්‍රියා පිලිබඳව තීරණ ප්‍රසිද්ධ කිරීම

- සුරැකුම් වෙලඳපොල සම්බන්ධයෙන් ආණ්ඩුවේ වැඩසටහන් සහ සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

- කවර හෝ ආකාරයකින් යම් නිශ්චල හෝ චංචල දේපලක් අත්පත් කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිනීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම

- සභාවේ අරමුණු සාක්ෂාත් කරගැනීම හෝ මේ පනත යටතේ එහි බලතල ක්‍රියාත්මක කිරීමට ආනුශංගික වන හෝ හිතකර වන වෙනත් සියලු ක්‍රියාවන් සිදු කිරීම

05) ශ්‍රී ලංකාවේ කොටස් වෙළඳපොල මෙහෙයවනීමේ වගකීම ඇති ආයතනය වන්නේ ?

කොළඹ කොටස් හුවමාරුව ( COLOMBO STOCKS EXCHANGE ) ( CSE )

මෙය සමාගම් පනත යටතේ ස්ථාපනය කර ඇති අතර, මෙරට තුල කොටස් වෙළඳපොල ගනුදෙනු කරගෙන යාම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙන් බලපත්‍ර ලබා ගෙන ඇති ඇපයෙන් සීමිත වූ සමාගමකි. මෙය තුල සාමාපික සමාගම් ( කොටස් තැරැව්කාර සමාගම් ) 15 ක් පමණ ඇත.

06) කොළඹ කොටස් හුවමාරුවේ ප්‍රධාන අරමුණු ?

- කොටස් සම්බන්ධ සේවාවන් ඇතුලුව අලෙවි කිරීම් මිලදී ගැනීම් හෝ හුවමාරු කරගැනීම් කටයුතු වර්ධනය කරගැනීම සඳහා උපකාර කිරීම
- ණය සඳහා ද්වීතියික වෙළඳපොලක් නිර්මාණය කිරීම වැඩි දියුණු කිරීම උපකාර කිරීම සහ සංවර්ධනය කිරීම
- විවිධ ආනුශංගික කාරණා සම්බන්ධයෙන් රෙගුලාසි සෑදීම
- වෙළඳපොල තොරතුරු ව්‍යාප්ත කිරීම
- කොලඹ කොටස් හුවමාරුව විසින් තීරණය කරනු ලබන අන්දමටවීවායේ පදනම් සහ ප්‍රමාණය අනුව සකසන ලද සේවාවක් සඳහා අයකිරීම් නියම කිරීම

07) කොලඹ කොටස් හුවමාරුව ( COLOMBO STOCKS EXCHANGE ) ( CSE ) තුල වෙළඳාම් කරනු ලබන සුරැකුම්පත් වර්ග ?

- සාමාන්‍ය කොටස්
- වරණීය කොටස්
- කොටස් බලපත්
- සංස්ථාපිත බැඳුම්කර

08) මධ්‍යම තැන්පතුධාරී ක්‍රමය ( CENTRAL DEPOSITORY SYSTEM ) ( CDS ) විස්තර කරන්න.

මෙය සම්පූර්ණයෙන් කොලඹ කොටස් හුවමාරුව සතු කාලීන සමාගමකි. මෙයට කොටස් වෙළඳපොල අතරමැදියෙකු ලෙස කටයුතු කිරීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙන් බලපත්‍ර ලබා දී ඇත. මධ්‍යම තැන්පතුධාරී ක්‍රමයේ මෙහෙයුම් රාමුව මධ්‍යම තැන්පතුධාරී ක්‍රමයේ රීති මගින් පාලනය වේ. ආසියා පැසිෆික් මධ්‍යම සුරැකුම්පත් තැන්පතුධාරී සමූහයේ ( ASIA PACIFIC CENTRAL

SECURITIES DEPOSITORY GROUP ) ක්‍රියාකාරී සාමාජිකයෙකි. මෙහි මෙහෙයුම් ආකෘතිය ජාත්‍යන්තර වශයෙන් පිළිගත් පරිචයන්ට අනුරූපීවේ.

09) ) මධ්‍යම තැන්පතුධාරී ක්‍රමයේ ( CENTRAL DEPOSITORY SYSTEM ) ( CDS ) කාර්යයන් ?

සුරැකුම්පත් සටහන් කිරීම, නඩත්තු කිරීම සඳහා සහ සුරැකුම්පත් හුවමාරු කිරීම ලියාපදිංචි කිරීම යන කරුණු සඳහා ඉලෙක්ට්‍රොනික සටහන් කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සහ එය නඩත්තු කිරීම

ඒ අනුව මෙම ක්‍රමය මගින් කිසිම භෞතික සංචලනයකින් හෝ සහතිකපත් පිටසන් කිරීමකින් හෝ හුවමාරු කිරීමේ ලියවිලි ක්‍රියාත්මක කිරීමකින් තොරව සුරැකුම්පත් වල හිමිකාරීත්වය මාරු කිරීමක් සිදු කරයි.

10) ) මධ්‍යම තැන්පතුධාරී ක්‍රමය ( CDS ) විසින් හසුරුවනු ලබන ගනුදෙනු ?

- සුරැකුම්පත් තැන්පත් කිරීම
- සුරැකුම්පත් මාරු කිරීම
- සුරැකුම්පත් සඳහා පොරොන්දු ලබා දීම
- පොරොන්දු නිදහස් කිරීම
- සුරැකුම්පත් ඉල්ලා අස්කර ගැනීම
- සංස්ථාපිත කටයුතු
- අර්ධ වශයෙන් අවලංගු කිරීම්

## අභ්‍යන්තර වෙළඳාම

කොටස් වෙළඳපොලක ආයෝජන සියල්ල, ආයෝජකයන් සතු තොරතුරු මත පදනම් වේ. ඒ නිසා කොටස් වෙළඳපොලක ගනුදෙනු සම්බන්ධයෙන් " තොරතුරු " යනු ඉතා වැදගත් සාධකයකි. මහජනයා සතු තොරතුරු මත කොටස් වෙළඳපොල මිල ගණන් උච්ඡාවචනය වේ. රටේ ආර්ථිකය, කර්මාන්ත, ආයතන හෝ මූල්‍ය වෙළඳපොල පිළිබඳ අසුභ තොරතුරක් කොටස් වෙළඳපොල කොටස් මිලගණන් පහල දැමීමට සමත් වන අතර, රටේ ආර්ථිකය, කර්මාන්ත, ආයතන හෝ මූල්‍ය වෙළඳපොල පිළිබඳ සුභ තොරතුරක් කොටස් වෙළඳපොල කොටස් මිලගණන් ඉහල දැමීමට හේතුවේ.

යම් සමාගමකට සම්බන්ධිත පුද්ගලයෙකු වෙතින් සෘජුවම හෝ වක්‍රාකාරයෙන් ලබාගන්නා ලද මහජනයාට විවෘත නොවන කොටස් වෙළඳපොල මිල සංවේදී තොරතුරක් භාවිතා කරමින් ඒ ඔස්සේ කොටස් වෙළඳපොල ගනුදෙනු වලට සම්බන්ධ වෙමින් යම් අයෙකු අයුතු ලාභයක් උපයා ඇත්නම් එය අභ්‍යන්තර වෙළඳාමක් සේ සැලකේ.

මෙහි අභ්‍යන්තර වෙළඳාම සුදු කරපටි අපරාධයක් ලෙස සැලකේ. ඒ අනුව යම් සමාගමකට සම්බන්ධ පුද්ගලයෙකු එම සමාගමේ තමා සතු, මහජනයාට විවෘත නොවන, කොටස් වෙළඳපොල මිල සංවේදී තොරතුරක් භාවිතා කරමින් කොටස් වෙළඳපොල ගනුදෙනු වලට සම්බන්ධ වෙමින් අයුතු ලාභයක් උපයා ඇත්නම් එය අපරාධයකි.

**ලෝඩ් ඇඩ්වොකේට් එරෙහිව මැකී**

මෙම නඩුවේදී සමාගමක සභාපතිවරයා විසින් වෘත්තීය මූල්‍ය විශ්ලේෂකයෙකු වෙත සමාගමේ අනාගත ලාභ සම්බන්ධ අවදානම පිලිබඳව කරුණු පැහැදිලි කරන ලදී.සභාපති වරයාගෙන් ලද තොරතුරු මූල්‍ය විශ්ලේෂකවරයා විසින් සිය මිතුරන් දෙදෙනෙකුට හෙලි කල අතර, ඔවුන් එම තොරතුරු මත කටයුතු කරමින් කොටස් වෙළඳපොල ගනුදෙනු ආශ්‍රිතව විශාල ලාභයක් උපයන ලදී. අධිකරණය මෙහිදී තීරණය කලේ මෙහිදී අභ්‍යන්තර වෙළඳ ගනුදෙනුවක් සිදුව ඇති බවත් එය නීතිවිරෝධී බවත්ය.

මෙරට තුල අභ්‍යන්තර වෙළඳාම නීතිවිරෝධී කටයුත්තක් බවට පහත නීතීන්හි ප්‍රතිපාදන අන්තර්ගතය.

- 2007 අංක 07 දරණ සමාගම් පනත
- සුරැකුම්පත් සහ විනිමය පාලන කොමිෂන් සභා පනත
- සමාගම් අත්පත් කරගැනීම් සහ සංයෝජනය පිලිබඳ සංග්‍රහය

## කොටස් වෙළඳපොලෙන් පරිබාහිර ගනුදෙනු ( Off - Floor Transactions )

සුරැකුම්පත් සහ විනිමය පාලන කොමිෂන් සභා පනතේ 28 වන වගන්තිය අනුව බලයලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කරන පොදු සමාගමක කොටස් දරණ කිසිම තැනැත්තෙකු ඒ බලයලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් යොදා ගනු ලබන වෙළඳ කාර්ය පටිපාටියට අනුකූලව මිස, ඒ කොටස් නොවිකිනීය යුතුය.

වෙනත් වචන වලින් කිවහොත්, කිසිදු සමාගමක කොටස් හිමියෙකුට සුරැකුම්පත් සහ විනිමය පාලන කොමිෂන් සභාවේ අවසරයකින් තොරව, කොලඹ කොටස් හුවමාරුවෙන් පරිබාහිරව කොටස් මිලදී ගැනීම හෝ විකිනීම සිදු කල නොහැක.